අංක ව/පස/2/1/19(31)

# වයඹ පළාත් සභාව

වයඹ පළාත් සභාවේ අංක 5 දරන වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිළිබඳ (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ, පළාත් සභාව විසින් 2003.12.16 වැනි දින සම්මත කරන ලදුව 2003.12.19 වැනි දින වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේම දැන ගැනීම සඳහා මෙහි පළ කරමි.

එස්. හිරිමුතුගොඩ,
ලේකම්,
වයඹ පළාත් සභාව

2004.02.23 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

## වයඹ පළාත් සභාවේ 2003 අංක 5 දරන
## වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිළිබඳ (සංශෝධන) ප්‍රඥප්තිය

වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 09 දරන වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිළිබඳ ප්‍රඥප්ති සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය වයඹ පළාත් සභාවේ 2003 අංක 5 දරන වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිළිබඳ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවෙනි කොටසේ 4 (ආ) උප වගන්තියට ඉක්බිතිවම මතු දැක්වෙන (ඇ) උප වගන්තිය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ. *ප්‍රධාන ප්‍රඥප්තියේ 4 සංශෝධනය කිරීම.*

   (ඇ) දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන ව්‍යවස්ථාපිත ආයතන හා පෞද්ගලික අංශයේ ඉදිකිරීම්, අලුත්වැඩියා හා නඩත්තු කොන්ත්‍රාත් භාර ගැනීම හා ඊට අදාල ගිවිසුම්වලට එළඹීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වෙනි කොටසේ 6 (උ) උප වගන්තියට ඉක්බිතිව මතු දැක්වෙන (ඌ) උප වගන්තිය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ. *ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වැනි වගන්තිය සංශෝධනය කිරීම.*

   (ඌ) ඉහත 4(ඇ) කාර්යයන්, කොන්ත්‍රාත් ගිවිසුම් අනුව නිම කිරීම.

4. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය. *අනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

04-323/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.